# රූපාංජලී

## සිනමාවේ සිද්ධාන්ත
## සහ
## සිනමා රසවින්දනය

බර්ට්‍රම් නිහාල්

# රූපාංපේලී

## සිනමා සිද්ධාන්ත සහ සිනමා රසවින්දනය

බර්ට්‍රම් නිහාල්

ප්‍රකාශනය සහ බෙදාහැරීම

BERT PUBLICATION

# පෙරවදන

සිනමාව යුරෝපීය සමාජයෙහි සම්භවය ලබා සියවසකට අධික කාලයක් ගත වී තිබේ. වර්තමානය වන විට සංකීර්ණ සංකේතමය මාධ්‍යයක් ලෙසින් ප්‍රේක්ෂක ප්‍රතිචාර සහ පරිකල්පන මත විචාරයට ලක් වෙමින් ආසියානු සමාජයෙහි ද සිනමාව ව්‍යාප්ත වී තිබේ. සිනමාවේදය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඇති කර ගැනීමට නම් ශික්ෂණාන්තර ගවේශනයකට ගමන් කළ යුතු ය. මෙම ශික්ෂණක්‍රමවේදය ලෝකයේ සමාජ සංස්කෘතික ස්වරූප සහ ආර්ථික දේශපාලනික හැසිරීම්හි ද සුවිශේෂිතා පැහැදිලි කරන්නාක් මෙන්ම සිනමාව තුළ ගොඩ නැගෙන විවිධ තේමාවන් හා බැඳෙන මත සහ දෘෂ්ටිවාද තුළින් සිනමාව ද විචාරය කර ගත හැකිය. සිනමා විචාරකයකුට මෙම තේමාවන් අර්ථ කථනය කර ගැනීමට එක් දෘෂ්ටිවාදයක් පමණක් ප්‍රමාණවත් නොවන බව පැහැදිලි ය. බටහිර දෘෂ්ටිවාද අවශෝෂණය කර ගනිමින් සිනමාව කියවීම සඳහා වඩාත් පොහොසත් දෘෂ්ටිවාදයක් ගොඩනගා ගත හැකි වන්නේ නම් එය සිනමාව විචාරය කළ හැකි ප්‍රබල සෞන්දර්යවාදි කතිකාවක් වනු ඇත. එසේ නොවුන හොත් චිත්‍රපට විචාරය තුළින් ගොඩ නැගෙන සංරචක ප්‍රේක්ෂක ප්‍රජාවට අහිමි වනු ඇත. එවිට චිත්‍රපට විචාර ගුරු කුල හෝ ප්‍රශස්ත කතිකාවන් සිනමා විචාරකයන් තුළින් බැහැර වනවා පමණක් නොව ඒ පිළිබඳ ශාස්ත්‍රාලයීය බුද්ධිමතුන්ගේ කාර්යභාරය ද සමාජයේ ආන්තික වනු ඇත.

සිනමාව පිළිබඳ නිශ්චිතවම ගොඩ නගා ගනු ලබන දැනුම තුළින් ප්‍රේක්ෂකයා නිර්දෘෂ්ටිකභාවයෙන් (Visionlesseness) ගලවා ගනු ඇත. එමෙන්ම ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂක ප්‍රජාව තුළ සිනමා දර්ශන පාදක කොට ගෙන ගොඩ නැගෙන ප්‍රබල දෘෂ්ටිවාදයක් නොමැති වීමේ ගැටලුව ද ප්‍රබල ය. සිනමාව පිළිබඳ ඇති නිර්සාක්ෂරතාව (Illiteracy) නිසා සිනමාව විසින් ගෙන එන දාර්ශනික තේමාවන් ජීවන චර්යා හා සම්පාත කර ගැනීමේ මිනිස් අවශ්‍යතා ද මගහැරී යනු ඇත. ඒ අනුව සිනමා සාක්ෂරතාව (Literacy) සිනමාව තුළින් ගොඩ නගන අධියථාර්ථයෙන් (Hyper Reality) පුද්ගලයා බැහැරට ගෙන යාමට හේතු

වනු ඇත. මේ අනුව සිනමාව පිළිබඳ විචාර මාර්ගයේ දී මාක්ස්වාදී දාර්ශනික විශ්ලේෂණය, පශ්චාත් මාක්ස්වාදී ක්‍රමවේදාත්මක නැඹුරුව, අපෝහකය, විසංයෝජනය, ස්ත්‍රීවාදී කතිකාව, සංඥාර්ථවේදී විමසුම, සාංදෘෂ්ටිකවාදය, සංස්කෘතිය සහ මනෝ විශ්ලේෂණවාදය, ව්‍යුහවාදය, පශ්චාත් ව්‍යුහවාදය, ප්‍රපංචවේදය, ආදිය දැනුම් ශිෂ්ටාචාරයෙහි ක්‍රමවේදීය භාවිතාවන් බවට පත් කර ගත යුතු ය. මේ තුළින් පැහැදිලි වන්නේ සිනමාව පිළිබඳ නැවත කියවීමේ දෘෂ්ටිමය අවිය ගොඩනගා ගැනීම පමණක් නොව සිනමාවේ රම්‍යතාවය ද ආත්මගත කර ගත හැකි වන ක්‍රමවේදී ස්වරූපයේ භාවිතාවයි.

මේ අනුව චිත්‍රපටගැඹුරින් අවබෝධ කර ගැනීම පිළිබඳ යුරෝ-කේන්ද්‍රීය දාර්ශනික ප්‍රවණතා බුද්ධිමය සන්දර්භයක් තුළ සමාජගත කිරීම ශාස්ත්‍රාලයීය කාරණාවක් බවට පත් වේ.සිනමා නිර්මාණකරුවාගේ දෘෂ්ටිමය සවිඥානිකත්වය මතුකර ගත හැක්කේ මෙන්ම, ප්‍රතිඅර්ථකථනය කරගත යුතු වන්නේ ද මෙවැනි ශාස්ත්‍රාලයීය දෘෂ්ටිමය සන්දර්භයක් තුළ ය.

සිනමාව යන්න සෞන්දර්යකලාවේදය තුළ පමණක්ම අර්ථවත් වන්නක් නොවේ. සෞන්දර්ය කලා ශාස්ත්‍රාලයීය පිවිසුමෙන් සමාජ සංස්කෘතික සන්දර්භයපිළිබඳ ප්‍රශස්ත කතිකාවකට භාජනය කිරීමේ දෘෂ්ටිවාදී මැදිහත් වීම සිනමාවේ ප්‍රබලතම විභවතාවකි. නමුත් ශ්‍රී ලාංකීය සිනමාවේ විචාරවාදී කලාවෙහි මතවාදී දුගී භාවය ප්‍රබල වන අතර, එහි ස්වරූප සහ තත්ව බටහිර ශාස්ත්‍රාලයීය ශික්ෂණ මාර්ගය සමග සංසන්දනය කර ගැනීමේ දී පැහැදිලි කර ගත හැකි ය. ඒ තුළින් සමාජය වෙනස් කරලීම සඳහා අවශ්‍ය සක්‍යතා සිනමා කලා මාධ්‍ය තුළ පවතින බව අපි විශ්වාස කරමු. සිනමාව පමණක් නොව සිනමා විචාරය ද දේශපාලන ගුණයෙන් යුක්ත බව පැහැදිලි ය. මේ තුළින් විශ්ලේෂණය වන්නේ සිනමා පාරිභෝගික අවකාශය කපා කොටා දැමීමක් නොව දේශීය සමාජ සහ සංස්කෘතික සීමා අභිභවනය කරමින් ශ්‍රී ලාංකීය සිනමා විචාරවාදය ගමන් කළ යුතු බවට අදාල තර්කය යි. එසේ නොවුණහොත් සිනමා විචාර දෘෂ්ටි ඌනතාවේ පමණක් නොව

සමස්ත කලාව සහ මානව හැසිරීම් පිළිබඳ කියවීමේ දෘෂ්ටි ඌනතාවේ සදාකාලික ලැග්ම (Lag) පරිධියේ අප වැනි රටවල වර්ධනය වනු ඇත.

සිනමාව සහ සිනමා කථිකාවේ සැබෑ අඩංගුව සංස්කෘතික කාරණාවන්ගෙන් සහ සමාජ කාරණාවන්ගෙන් බහිෂ්කරණය නොවීමට ඇති සාධක බහුල බව ඒ පිළිබඳ ශාස්ත්‍රාලයීය කියවීමෙන් පැහැදිලි ය. කලා සංස්කෘතියක ප්‍රාමාණික කෘත්‍ය ඥානනය කරන විට අවධාරණය වන්නේ සමාජයේ ප්‍රගමනයේ ක්‍රියාව තුළවිචාරශීලී මිනිසෙකු සහ සබුද්ධික මිනිසෙකු ලෙස ප්‍රතිෂ්ඨාපනය වීම සඳහා අවශ්‍ය විෂය කාරණාවන්ගේ අඩංගුවයි.

මෙම පශ්චාත් නව්‍යවාදී ලෝකයේ තාක්ෂණික ධනවාදයේ බලපෑම චිත්‍රපටයට පමණක් නොව ප්‍රේක්ෂක ප්‍රභූත්වයේ සිට පාරිභෝගිකත්ව නිර්මාණකරණය දක්වා සිදුව ඇති ආකරෙය පැහැදිලි ය. මෙම තාක්ෂණික අධිකාරීත්වයේ භාවිතාව මගින් සිනමාවේදය තුළ පමණක් නොව සමස්ත සමාජ ක්‍රමවේදයෙහිම මිනිසාගේ සබුද්ධිකත්වය සහ විචක්ෂණ බව සම්බන්ධ විඥාපන සිතියම (Cognitive Map) බිඳ දමා ඇත.එහි ප්‍රතිඵලය නම් පශ්චාත් නව්‍ය අවධියේ ප්‍රේක්ෂකයාගේ නිහඬ බවයි. එමෙන්ම ඔහුට නිවැරදි දෘෂ්ටිවාද සහ දර්ශන පදනම් කර ගෙන නිශ්චිත වූ ජීවන දෘෂ්ටියකයට අනුගත වීමේ නොහැකියාවේ නිශ්චිතයෙන් ද පශ්චාත්තාප වීමට සිදු වීමයි. ඔහුට තමා ජීවත් වන සමාජ සංස්කෘතියේ මූලික යථාර්ථය තුළ නොව සංස්කෘතියේ උපරි ව්‍යුහයේ අවමානුෂීකරණයට ද (Dehumanization) බරපතලව ගොදුරු වීමට සිදු වනු ඇත.

සිනමාවේ නූතන ව්‍යාපෘති තුළ සංස්කෘතිය නිර්මාණය කළත්, පශ්චාත් නූතනවාදී සිනමාවේ සංස්කෘතිය නොනිර්මාණය කිරීමට වග බලා ගනී.එමෙන්ම පශ්චාත් නව්‍යවාදී සිනමා ආකෘති සහ එහි රටා තුළ සංස්කෘතිය ප්‍රතිනොනිර්මාණය කිරීමට අදාළ විෂයකරණය සිදුකර ගෙන තිබේ. එහෙත් සමාජ සංස්කෘතික කාරණාව සිනමාව තුළ අති ප්‍රබල ය. ඒ අනුව ඉහත සංස්කෘතික නොනිර්මාණය ගැන පැවසුවත්

සංස්කෘතියේ ස්වරූප පමණක් වර්තමාන සිනමාව විසින් වෙනස් කොට ගෙන තිබෙන ආකාරය පැහැදිලි ය. සමාජය යනු සංස්කෘතික නිර්මාණයක් යැයි කීම නිවැරදි යැයි සිතේ. මේ දෙක වෙන් කළහොත් සංස්කෘතියේ පරමාදර්ශී ස්වරූපයක් දක්නට ලැබෙන අතර සමාජයෙහි එහි ස්වරූප ද බිඳ වැටෙනු ඇත. මෙම අධිපතිවාදී කතිකාවේ ග්‍රහණයෙන් බහිෂ්කරණය නොවන සිනමාව තාක්ෂණික ධනවාදය විසින් නව්‍යවාදී කලා මාධ්‍ය වර්ග සංකලනයකට ද කැඳවා තිබේ. එනම් විවිධ අනුප්‍රභේද සම්මිශ්‍රණය කරමින් පරස්පරාපේක්ෂ අනේකමිතියක් බිහිකිරීම සිනමා කර්මාන්තකරුවන්ගේ වෙළඳපොළකරණය බවට වර්තමානයේ පත්ව තිබීමයි. නිදසුන් ලෙස විද්‍යා ප්‍රබන්ධ චිත්‍රපට, සංගීතමය චිත්‍රපට, රහස් පරීක්ෂක චිත්‍රපට යනා දී වශයෙනි. මින් පිළිබිඹු වන්නේ ද මානව සමාජ හැසිරීමේ නව දිශානතීන් මිස නිර්සංස්කෘතික ලක්ෂණ නොවේ. මෙහි පිළිබිඹුව නම් මානව මනසේ ගොඩ නැගෙන හඹායාම (Pursue), අත්පත් කර ගැනීම (Achievement), යටත්කරණය (Submission), වසඟකරණය (Seduction) යනාදිය යි. සංස්කෘතික සාධක තුළ ඇත්තේ ද මෙවැනි තත්ත්ව බව සංස්කෘතිය විසංයෝජනය කිරීමේ දී පැහැදිලි වේ. ඒ අනුව පෙනෙන්නේ මෙය සිනමාව තාක්ෂණය හා බද්ධ වීමෙන් නිර්මාණය වූ තවත් ඵලයක් බවයි. මේ තුළ පැහැදිලි වන්නේ ද මිනිසාගේ මනෝ හැසිරීමේ කැඩපත්කරණය යි.

අනෙක් අතට පශ්චාත් නව්‍යවාදී සමාජයේ සිනමා විචාරවාදයන්හි දී කාන්තාවාදය, ඉතිහාසවාදය, ලිංගිකත්වවාදය ආදිය නව දෘෂ්ටි කෝණයකින් විවරණයකට භාජනය කොට ඇත. මේ අනුව සිනමා විචාර කලාවේ මෙතෙක් ගොඩනැංවූ විචාරවාදයන් බිඳ වැටී නව්‍ය විචාර කලාවකට අවතීර්ණ වෙමින් පවතින අතර එහි අත්‍යවශ්‍යක බව නව සිනමා කර්මාන්තය විසින් පෙන්වා දී ඇත. නව සිනමා පරිණාමිය අවශෝෂණය කර ගත හැකි බහු දෘෂ්ටික සිනමා විචාරවාදයක අවශ්‍යතාවය ද මේ අනුව පැන නැගේ.

මෙතෙක් සංස්කෘතික අධිපතිවාදී කතිකාවෙන් බැහැර නොකොට පීඩාකාරී ස්වරූපයකට හසු කර තිබූ ලිංගිකත්වය පිළිබඳ

ප්‍රකාශන නූතන තාක්ෂණික ධනවාදය සහ ප්‍රචාරණ කලාව විසින් තවදුරටත් සමාජයේ ආන්තිකකරණය නොකොට නූතන සමාජ මාධ්‍යයට විවෘත මුහුණුවරකින් අවතීර්ණ කොට ඇත. ආදර වස්තුව හා ආදර කලාප යථාලොව තුළ හමු නොවීමට අදාළ සංස්කෘතික යටත්කරණය (Cultural Submission) සිනමාව තුළින් පැහැදිලි කරයි.මේ තුළින් පිරිමි සංකේතීය ප්‍රාග්ධනය අහිමි කර ගනිමින් පිරිමි විෂයයේ (Male Subject) අර්බුදය ගැහැනිය ඉදිරියේ ඉස්මතු කරවීමෙන් ප්‍රතිසංස්කෘතික (Counter Culture) විනිශ්චයක් ගොඩනැංවීමේ කාර්යය ද සිනමාව සිදු කරයි. මේ පිළිබඳව අවබෝධ කර ගැනීමට නම් මනෝ විශ්ලේෂණවාදී සිද්ධාන්ත මූලිකව සිනමාව කියවීම අත්‍යවශ්‍ය වේ.

එමෙන්ම ඡායාරූපකරණයේ සහ සිනමාවේ විභවතාවක් වන්නේ රූප සංජානනයට (Perception) වැඩි ඉඩක් ලබා දීමේ හැකියාවයි. මෙනයින් ඉතා ප්‍රබල යැයි සැලකෙන මිනිසාගේ මනෝලිංගික කලාපයට (Psycho- Sexual) ඇතුලු වීමේ හැකියාවත්, ඒ තුළින් මිනිසාගේ ආශාවේ කලාපයන් (Zones of Desire)උත්තේජනයටත් අවකාශය සලසා ගැනීමත්, මිනිසා කම්පිත කිරීමේ ක්‍රමවේද අවශෝෂණය කර ගැනීමත් සමග අන් කවරදාකටත් වඩා පාරිභෝගික අවකාශය තුළ අධිපතීත්වය ගොඩ නඟා ගැනීමට හැකි වී තිබේ. මේ තුළින් පැහැදිලි වන්නේ ද මේ පිළිබඳ සමාජ සංස්කෘතික පීඩනයෙහි ස්වරූපය යි. මෙවැනි සමාජ සංස්කෘතික පරිසරයක පාරිභෝගිකකරණය වන නූතන මාධ්‍යයෙහි ස්ථාවර වීම අනිවාර්ය සාධකයක් වනු ඇත.

සිනමාව පිළිබඳ කියවීමේ දී බුද්ධිමය සන්දර්භයෙහි එක් ප්‍රබලතම කේන්ද්‍රීය සංකල්පයක්ගොඩ නැඟෙන්නේ සංඥාර්ථවේදය පදනම් කර ගැනීමෙනි. මිනිසා වර්තමානයේ ජීවත් වන්නේ පශ්චාත් නව්‍ය සමාජ අවධියක ය. සන්නිවේදනය සහ තොරතුරු සැකසීම, දැනුම් කර්මාන්තය ආදියෙන් සමාජයේ සංවිධානමය රටාවේ ආකෘතියෙන් සමාජය විතැන් කිරීමට සමත් වී තිබේ. සිනමාව සහ සන්නිවේදනය තුළින් සංඥා, හිස් හැඟවුම්කාරක (Empty Signifiers) ලෙසත්, ව්‍යාජ සංඥා (False Signs) ලෙසත් ප්‍රතිනිෂ්පාදනය කරමින් ස්වයං

අවබෝධය ව්‍යාප්ත්ව නිර්මාණයකට ගෙන යමින් තිබේ. නිද්‍රාකරණයට ලක් වූ (Anesthetized) ප්‍රේක්ෂක පාරිභෝගිකයා අවදි කිරීමේ යම් අනුක්‍රමිකයක් බවට ද සංඥාර්ථ පිළිබඳ අවබෝධය ගොඩනගා ගත හැකි ය. මේ තුළින් නිෂේධනාත්මක ප්‍රතික්ෂේපකරණයකට වඩා විචාරාත්මක ආරක්ෂා කිරීමක් සිදු වනු ඇත.

සිනමාව ප්‍රකාශන විධික්‍රමයක් ලෙස තුලනාත්මක සමාජයෙහි දෘෂ්ටිගෝචර සංකේත මාලාවක් සමගින් ප්‍රේක්ෂක ප්‍රජාව හා සම්බන්ධ වීම සිදු වේ.මෙම සංකේත පිළිබඳ සමාජ සංස්කෘතික අර්ථය ප්‍රේක්ෂක විඥානය තුළ තිබේ නම් ඔවුන්ට සාරවත් අත්දැකීමක් ලබා ගත හැකි ය. එහෙත් ලෝක විෂය තුළ සංඥාර්ථ භාවිතයේ දී යම් හිතුවක්කාර (Arbitrary) ස්වරූපයක් දැකිය හැකි බව සිනමාව තුළින් පැහැදිලි වේ. එනම් සංඥා එම සමාජ සංස්කෘතියේ හැඩය ගැනීමයි. සංඥාර්ථය අදාළ සමාජ සංස්කෘතික නිර්මාණයකි. මේ අනුව ලෝක සමාජ සංස්කෘතික පරිසරයන් හා ව්‍යුහයන් තුළ එකම දෙය වුව විවිධ අයුරින් එවිට අර්ථ ගැන්වුනු ඇත. එලෙස වීමට නම් පුළුල් සමාජ පිළිගැනීමක් ද ඒ සඳහා තිබිය යුතු වේ.

සංඥාර්ථවේදය සහ සිනමාවේදය යනු එකිනෙකින් වියුක්ත කළ හැකි සංකල්ප නොවේ. සිනමාවේදයෙහි සංඥා යනු එහි පැවැත්මේ ප්‍රධාන මූලධර්මය යි. සංඥාර්ථ භාවිතාවෙන් තොර වූ මානව සමාජ ක්‍රියාවලියක් දැකිය නොහැකි ය. එය දෘෂ්‍ය සංජානනයට පමණක් නොව මානව ශ්‍රව්‍ය ආයතන වලට ද විෂය වන්නකි. එම සංඥාර්ථ සඳහා සැකසුනු වටිනාකම් ද පවතී.

සමාජයක සංකේතීය පිළිවෙළ සකස් වන්නේ ඒ පිළිබඳ නිශ්චිත ක්‍රමවේදයක් තුළින් පිළිගන්නා අවනතභාවය (Obedience) මගිනි. සංඥා සහ සංකේත යනු මානව සමාජ ව්‍යුහීය සංස්ථාපනයෙහි එකක් පමණි. මෙහි ප්‍රයෝජ්‍ය වටිනාකම් (Use Value) මෙන්ම හුවමාරු වටිනාකම් (Exchange Value) ද පවතී. පරිකල්පනය (Imagination) සහ යථාව (Real) යනු මේ සමග සම්බන්ධිත තව ද ප්‍රධාන මූලධර්ම

දෙකකි. ඒ අනුව සිනමාවෙහි මානව සමාජ කාරණාවන් සමාජ හා සංස්කෘතික කාරණාවන් දක්වා විතැන් කිරීමේ දී තීරණාත්මක කාර්යයක් ද සංඥාව සිදු කරයි. සිනමාව කලාව තුළ නිර්වචනය කළ හැකි ද යන්න පිළිබඳ මතවාදී ගැටලුවක් පැවතුන ද, සිනමාවේ කලාව පිළිබඳ ගොඩ නැගෙන අර්ථ නිරූපණය ද වැදගත් වේ. ඒ අනුව කලාවේ ප්‍රබලතම කාර්යභාරයක් වනුයේ සමාජ සංස්කෘතියක සංකේතීය ව්‍යුහය සකස් කිරීමයි.සමාජ සංකේතීය ව්‍යුහයේ කෘත්‍ය යනු සමාජ ස්ථාවරය (Social Stability) ඇති කිරීමයි. මිනිස් ශිෂ්ටත්වය යනු ද නිවැරදි සංඥාර්ථ ක්‍රමවේදයකට අනුගත වීම සහ නිශ්චිත නිෂ්පාදන සබඳතා හරහා ගමන් කිරීමයි.මානව සමාජය තුළ ගොඩ නැගෙන සංඥාර්ථය සහ සිනමාව තුළ ගොඩ නැගෙන සංඥාර්ථ තුළින් පෙරලා මානව සමාජයම සංස්කෘතිකකරණය කර ගනී.

සිනමාවට විචාර කලාවක් අවශ්‍ය ය. මේ තුළින් සිනමාව පිළිබඳ මතවාදය සැකසේ. සිනමාවේදය ප්‍රේක්ෂකත්වයට වඩා ඉහළින් පවතී. සිනමාව සහ ප්‍රේක්ෂකත්වයේ අවියෝජනීය සබඳතාවය සඳහා විචාරය ප්‍රබල කාර්යභාරයක් ඉටු කරයි. සිනමා කෘතීන්හි සංකේතාත්මක සංඥාවන් (Symbolic Signs), ප්‍රතිකෘත සංඥා (Iconic Signs) සහ දර්ශක සංඥා (Indexical Signs)සිනමාවෙහි රැඩිකල් අර්ථයන් සඳහා පවා භාවිතා වේ. දර්ශක සංඥා තුළ පමණක් නොව සංඥාර්ථ ගොඩනැගීමේ දී හැඟවුම්කාරකය සහ හැඟවුම අතර හේතු කාරක (Casual) සබඳතාවක් දගොඩ නැගේ. මෙය සමාජ සංස්කෘතික පර්යාවලෝකනයට අනුව තනි පුද්ගලයකුගේ දෘෂ්ටි කෝණයක් නොවේ. සංඥාවේ අර්ථය සමාජ කේන්ද්‍රිය ය. ධ්වනියානුකරණය (Onomatopoetic) තුළ ද ප්‍රතිකෘත ලක්ෂණ දැකිය හැකිය. කලා කෘතියක් තුළින් අධියථාර්ථවාදයක් (Super Realism) මෙන්ම ඉන්ද්‍රජාලික යථාර්ථවාදයක් (Magic Realism) මෙන්ම සංයෝජන සබඳතා සහ විසංයෝජන (Deconstruction) සබඳතා ද ගොඩ නැගිය හැකි ය. මෙය සිනමාවේදය තුළ පමණක් නොව අනෙකුත් කලා ආකෘති (Forms of Arts) වන කවිය, ගීතය,

නවකතාව, නාට්‍ය ආදී සියලු කලා කෘතීන් තුළ ද මෙම සත්‍යතාවය පවතී. ඒ අනුව සංයෝජනය සහ විසංයෝජනය ක්‍රම විද්‍යාව බවට පරිවර්තනය කර ගනිමින් සිනමාව සහ අනෙකුත් කලා කෘති කියවීම අනුභූතිය බවට පත් කර ගත යුතු ය.

සමාජයේ වෙනස්කම් සමග කලාවේ වෙනස්කම් ද ගොඩනැගී තිබේ. කලාව සමාජ වෙනස සඳහා බලපෑවේ ද? සමාජ වෙනස කලාව සඳහා බලපෑවේ ද යන්න පුළුල්ව සිතිය යුතු මූලික ගැටලුවකි. කලාව 'සමාජ ප්‍රගතිය' සහ 'සමාජ වෙනස' සඳහා පවතින්නේ නම් නූතන සමාජයේ කලාව අවසන් කොටගෙන ඇති බව හැඟේ. සමාජ පරිණාමයත් සමග කලාවේ මූලික සමාජ කාරණාවෙන් වෙන්ව විනෝදාස්වාදය (Entertainment) සැපයීමේ සමාජ කාර්යය දක්වා මාරු වී කලාවේ අර්ථයන් ප්‍රබල විපර්යාසයකට භාජනය කොට ගෙන තිබීම වර්තමානයේ දැකිය හැකි ය.

එමෙන්ම ඡායාරූප සහ සිනමා කලාව ලෝකයට නවතම රූප සංඥා ක්‍රමයක් තුළින් නව අත්දැකීම් ප්‍රපංචයක් (Phenomenon) නිර්මාණය කොට තිබේ. එය පියවි ඇසින් දකින ලෝකයට වඩා වෙනස් වූ සංඥා සමූහයකට පුද්ගල මනස සංයෝජනය කරයි. සංඥා යන භාෂාවේ ව්‍යාකරණ පද්ධතිය මනාව වටහා නොගතහොත් ඒ තුළින් ධ්වනිත අර්ථ වටහා ගත නොහැකි වනු ඇත. සිනමාවේ ව්‍යාකරණය ඉතා ගැඹුරු ය. රූප සංයෝජනය තුළ ධ්වනිත අරුත් තනි රූප රාමුවක අර්ථයට වඩා රූප රාමු කිහිපයකින් ගොඩ නැගෙන අර්ථය වෙනස් ය. ඒ අනුව ඒකකය සහ සමස්තය යන ක්‍රමවේදය ද සිනමාව පිළිබඳ කියවීමේ දී වැදගත් ය.

එමෙන්ම එක් සමාජ සංස්කෘතික ව්‍යුහයක් තුළ ගොඩනැගෙන අරුත තවත් සමාජ සංස්කෘතියක දී තේරුම් ගැනීම අපහසු වන්නේ කිසියම් අයුරක කෝෂාර්ථමය සංඥා රටාවක් (Denotative Codes) ඒ තුළ නිර්මාණය වන බැවිනි. සිනමාව ප්‍රේක්ෂකයා තේරුම් ගන්නේ

කිසියම් නෛසර්ගික හැකියාවක් තුළින් නොවන අතර සංස්කෘතික ක්‍රියාදාමයක් තුළින් නිර්මාණය වටහා ගැනීමට පුරුද්දක් ලබා ගැනීමෙනි.

සංඥාවේ කෝෂාර්ථය වටහා ගැනීම මෙන්ම කෘතියෙහි හෝ සිනමාවෙහි ව්‍යාකරණය පිළිබඳ ගොඩ නගන අවබෝධය ද එහි ප්‍රගුණත්වය සඳහා හේතු වේ. සිනමා ව්‍යාකරණය බිඳ වැටෙන විට එහි අඛ්‍යානය (Narrative) වටහා ගැනීම ද පහසු නොවනු ඇත. සිනමා ආඛ්‍යානය පිළිබඳ සංඥාර්ථවේදී (Semiotic of Narrative) විශ්ලේෂණ ගොඩ නැගෙන්නේ සිනමාවේදය පිළිබඳ නව න්‍යායන්ගේ 70 දශකයේ ගොඩනැගීමත් සමගින් ය.

ඒ අනුව සිනමාවෙහි භාවිත සංඥා ක්‍රමවේදය තුළින් විවිධ මත සහ අර්ථ සංසරණය වනු දැකිය හැකි වේ. මතය යනු ස්වායත්ත විචල්‍යයක් නොවේ. එහි ඇත්තේ පරායත්ත ස්වරූපයකි. මතයේ අයිතිය මතය බද්ධ වන චෛතසිකයට ඇත් ද යන්න ගැටලුවකි. මතයන් සිත් තුළ ස්ථාපිත වන්නේ පුද්ගලයාටත් නොදැනුවත්වම ය. එය සියලුම මිනිස් ක්‍රියාකාරකම් සහ පද්ධති තුළ සංසරණය වනු ඇත. 19 වන සියවසේ බිහි වූ ඡායාරූප ශිල්පය සහ පසුව බිහි වූ සිනමාව සහ රූපවාහිනිය සමාජය පිළිබඳ පැහැදිලි මතයක් ඉදිරිපත් කරන්නේ යැයි කිව්වද ඒ පිළිබඳ තාක්ෂණික අවිය ගොඩ නගා ඇත්තේ සිනමාව පිළිබඳ අධිපතිවාදී මතයකි. ඒ අනුව සිනමාව යනු සැබෑවේ කැඩපතකටත් වඩා විද්‍යාවේ දියුණුවේ ප්‍රතිඵලයක් ලෙස ජනනය වූ උපකරණ සහිත වූ බහුජන කලාවකි. පුද්ගල කේන්ද්‍රීය DVD සිනමාව කාර්මික ධනවාදය පාරිභෝගික ධනවාදයට විතැන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ද සැලකිය හැකි ය. කලා කෘති නිපදවන්නා ද පාරිභෝගික අවකාශයට ගැලපෙන පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය කරන්නෙකුගේ තත්ත්වයට පත්ව ඇත. ඒ අනුව භාණ්ඩයේ නිෂ්පාදනය රසිකයාට නොව පාරිභෝගිකයාට ය. මින් පැහැදිලි වන්නේ ද අතීත ප්‍රේක්ෂකයාගේ පුරුෂාර්ථ වලට වඩා වර්තමාන පාරිභෝගිකයාගේ පුරුෂාර්ථ අතර වෙනස්කම් පවතින බවයි.

එමෙන්ම සිනමාව පිළිබඳ සංඥාර්ථවේදයේ ආපෝහක ගතිකයත්, විසංයෝජන ක්‍රමවේදයත් පිළිබඳ දැනුම ප්‍රේක්ෂක ප්‍රජාවගේ ගාමක දෘෂ්ටිවේදය බවට ද පත් වන විට සිනමාව පිළිබඳ කියවීමේ ස්වරූප ද ඔවුහු වෙනස් කර ගනු ඇත.

මේ අනුව සිනමාව පිළිබඳ කෘති කිහිපයක් රචනා කොට ඇති බර්ට්‍රම් නිහාල් මහතාගේ 'රූපාංජලී' නමින් සිනමා සිද්ධාන්ත සහ සිනමා රසවින්දනය අලලා රචිත නව කෘතිය පරිච්ඡේද පහලොවකින් සහ එක් උප ග්‍රන්ථයකින් සමන්විත වෙමින් සිනමා විචාරණ මූලිකාංග වෙත ගෙන යයි. මොහුගේ මෙම සිනමාව පිළිබඳ කෘතිය බුද්ධිමය පරිසරයත්, එයට අදාළ දෘෂ්ටිකරණය සමාජගත කිරීම සඳහාත් හේතු වේ. සිනමාව පිළිබඳ කලාවෙහි ප්‍රත්‍යවේක්ෂණය සඳහා පාදකය සංස්ථාපනිකකරණය සඳහා ගත් ප්‍රශංසනීය උත්සාහයක් ලෙස ද මෙය සැලකිය හැකි ය. මෙවැනි උත්සාහයන් තුළ සිනමාව පිළිබඳ දැනුම විස්ථාපනය කර ගැනීමටත්, තුලනාත්මක සමාජයෙහි චිත්‍රපටවේදයක් සකස් කර ගැනීමටත්, සිනමාව පිළිබඳ පර්යේෂකයන්ගේ ප්‍රධාන යුතුකමක් මෙන්ම වගකීමක් ද වන අතර එය ඉටු කරන අයුරු මේ තුළින් දැකිය හැකි ය. මේ අනුව සිනමාව සතු විභවයන් මෙන්ම සංස්කෘතික සිද්ධාන්ත අතර සබඳතාව ද මිනිස් විෂයක් (Human Subject) බවට තව දුරටත් ප්‍රේක්ෂක ප්‍රජාව තුළ සවිඥානික කිරීම ප්‍රශංසනීය වේ.

ආචාර්ය ධර්ම කීර්ති ශ්‍රී රංජන්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ජනමාධ්‍ය අධ්‍යයනාංශය / පර්යේෂණ මධ්‍යස්ථානය
ශ්‍රී පාලි මණ්ඩපය
කොළඹ විශ්ව විද්‍යාලය. 2014 ජූලි 15

# රූපාංජලී

## සිනමාවේ සිද්ධාන්ත සහ සිනමා රසවින්දනය

### බර්ට්‍රම් නිහාල්

සිනමා සහ රූපවාහිනී නිෂ්පාදකවරයෙකු, අධ්‍යක්ෂවරයෙකු, තිර කතා රචකයෙකු සිය මාධ්‍ය භාවිතය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් සහිතව රූපය මාධ්‍ය කොටගත් සිනමා කලාව සම්බන්ධ ග්‍රන්ථකරණයේ යෙදීම අතිශය දුලබ කරුණකි. ලෝකයේම වුව එවැනි අය ඇත්නම් ස්වල්පයක් පමණි. මා සිතන ආකාරයට බර්ට්‍රම් නිහාල් ඒ ස්වල්ප දෙනා අතරට අයත් වන්නෙකි. ශ්‍රී ලංකාවේ ටෙලිනාට්‍ය මාධ්‍යයට නව පරිච්ඡේදයක් ආරම්භ කරමින් ඔහු විසින් රචනා කරන ලද 'භාවනා' ඒකාංගික ටෙලිනාට්‍ය එකතුව ඉහත කී කරුණට නිදසුනක් ලෙස දැක්විය හැකි වෙතැයි සිතමි. දෘශ්‍ය කලාවේ විවිධ අංග පිළිබඳව රූපවාහිනිය හා සිනමාව කෙරෙහි විශේෂ අවධානයකින් ග්‍රන්ථ රචනා කරමින් පාඨකයාගේ නැණ නුවණ වඩවන බර්ට්‍රම්ගේ නවතම කෘතිය වන්නේ 'රූපාංජලී' ය. එම කෘතියෙහි අන්තර්ගත වන්නේ සිනමා කලාව සිනමා රසාස්වාදය මෙන්ම සිනමා කෘතියක සිනමානුරූපී ගුණය වැනි කරුණු පිළිබඳව අධ්‍යයනය හා අත්දැකීම් පදනම් කොටගත් ලිපි සමුච්චයකි. සිනමා රසවින්දනය අරමුණු කොටගෙන එහි ප්‍රායෝගික හා සෛද්ධාන්තික කරුණු පිළිබඳ අවධානයෙන් එක්කෙරුණු මෙම ලිපි සමුච්චය සිනමාව කෙරෙහි උනන්දුවක් දක්වන පොදු පාඨකයන්ට මෙන්ම විෂයයක් වශයෙන් සිනමාව හදාරණ විද්‍යාර්ථීන්ට ද වැදගත් වන ශාස්ත්‍රීය කෘතියක් ලෙස හඳුන්වනු කැමැත්තෙමි. මෙම කෘතියෙහි මා දකින විශේෂත්වය වන්නේ බර්ට්‍රම් නිහාල් අධ්‍යක්ෂවරයෙකු ලෙස ලද අත්දැකීම් හා පරිචය ද ඇසුරු කර ගනිමින් සිනමා සෞන්දර්යවාදය පැහැදිලි කිරීමය. එහි මූලිකාංග කෙරෙහි සොඳුරු ශාස්ත්‍රීය අවධානයක් යොමු කිරීමය.

මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු

B.A, Ph.D (ලංකා විශ්ව විද්‍යාලය)
D.Litt (සෞන්දර්ය විශ්ව විද්‍යාලය සම්මාන උපාධිය)

ISBN 978-955-8227-12-1

9 789558 227121

BERT PUBLICATION

50/6B, 1st Cross Street, Pagoda Road, Nugegoda, Sri Lanka.
Tel :+94 112810538 Fax : +94 112769406 e-mail : bertdavp@gmail.com

රු. 400/